**ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල මෙම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරිමක් නොවනු ඇත .වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ .

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිළධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

**(ආ)** ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම් යටතේ සමාලෝචිත වර්ෂය තුළදී ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් ලෙස රු.57,831,661 ක් සටහන් කර තිබුණද, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ - 6 ආකෘතියේ) සමාලෝචිත වර්ෂයේ එම වත්කම් මිලදී ගැනීම් රු.55,231,136 ක් ලෙස සඳහන් කර තිබූ බැවින් රු.2,600,525 ක වෙනසක් විය. | කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිල දී ගැනීමට සමාලෝචිත වර්ෂය තුල දරනු ලබන මුළු වියදම අදාල වත්කම් ශේෂයට නිවැරදිව එකතු කිරීම් කල යුතු වේ. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇති වත්කම් වටිනාකම නිවැරදිය. පරිගණක පද්ධතියට වත්කම් මිල දී ගැනීම් පිළිබඳ කේවල තොරතුරු උඩුගත කිරීමේ දෝෂයකින් දෙසැම්බර් මිල දී ගත් වත්කම් වල විස්තර භාණ්ඩාගාර ආකෘතියේ දී දක්වා ඇති වටිනාකම් අඩුවෙන් පෙන්වයි. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ 2019 දෙසැම්බර් 31 දිනට ගෘහ භාණ්ඩ ශේෂය රු.180,536,027 ක් ලෙස සටහන් කර තිබූ අතර මූල්‍ය නොවන වත්කම් සඳහා වන භාණ්ඩාගාර ආකෘතියේ (ආකෘති SA 82) එම වටිනාකම රු.179,204,431 ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,331,596 ක වෙනසක් විය. | භාණ්ඩාගාර ආකෘතිවල ශේෂයන් සහ ගිණුම් ප්‍රකාශනවල සඳහන් ශේෂයන් අතර වෙනස්කම් හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කල යුතු වේ. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇති වටිනාකම නිවැරදිය. පරිගණක පද්ධතියට වත්කම් මිල දී ගැනීමට අදාල කේවල තොරතුරු උඩුගත කිරීමේ දෝෂයකින් දෙසැම්බර් මිල දී ගත් වත්කම් වල විස්තර භාණ්ඩාගාර ආකෘතියේ දී දක්වා ඇති වටිනාකම අඩුවෙන් පෙන්වයි. |
| (ආ) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම්වලට අදාල ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම සමඟ කේවල වත්කම් ශේෂ වටිනාකම සැසඳී තිබිය යුතු වුවත් වත්කම් ශේෂ 6 ක රු.1,111,061,554 ක වෙනසක් විය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | භාණ්ඩාගාර පරිගණක ස්ථාවර වත්කම් වල ස්වයංක්‍රීය අංකනය පිළිබඳ දෝෂයක් හේතුවෙන් එකම වත්කම් අංකය වත්කම් අයිතම් කිහිපයකට සඳහන් වී තිබීම නිසා භාණ්ඩාගාර පරිගණක වැඩසටහනේ එම අයිතම ඉවත්කිරීමට නොහැකි වී ඇත. එම නිසා මෙම වෙනස සිදු වී ඇත. |

### 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| මුදල් රෙගුලාසි 104 (I) (අ) | සමාලෝචිත වර්ෂයේ සිදු වී තිබූ වාහන අනතුරු 18 කට අදාල හානි පූර්ණ මුදල | වාහන අනතුරු සිදු වූ වහාම එහි වගකිව යුතු පාර්ශවයන්, අලාභය හා | 2019 වර්ෂය තුල සිදු වී ඇති වාහන අනතුරු 18 න් මේ වන විට අනතුරු 07 ක පරීක්ෂණ |

| | | |
|---|---|---|
| රු.1,808,594 ක්වූ අතර එම අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හේතු නිශ්චය වශයෙන් දැන ගැනීම සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පවත්වා ඇත. ඉතිරි අනතුරු 11 හි පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 වියදම් කළමනාකරණය

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 අප්‍රේල් 08 දිනැති අංක 03/2019 සහ 2019 ජුනි 17 දිනැති අංක 04/2019 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ මගින් විදුලිය,ජලය, දුරකතන සේවා, ඉන්ධන මිලදී ගැනීම් සහ අනෙකුත් ගිවිසුම් ගත සේවාවන් සම්බන්ධයෙන් විධිමත් වියදම් පාලන ක්‍රමයන් පවත්වා ගත යුතු බවට උපදෙස් ලබාදී තිබියදී ඉන්ධන සහ විදුලිය වැය විෂයයන් වල වාර්ෂික ප්‍රතිපාදන සීමාවද ඉක්මවා පිලිවෙලින් රු.19,929 ක් සහ රු.1,589,929 ක් වියදම් දරා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව වියදම් පාලන ක්‍රමයක් පවත්වා ගැනීම සෑම ගණන්දීමේ නිලධාරියෙකුම සිදු කරනු ලැබිය යුතු වේ. | දිවයින පුරා පිහිටි අධිකරණවල විභාග වන නඩු වලට පෙනී සිටීම සහ අපරාධ ස්ථාන අනිවාර්ය පරීක්ෂා කිරීම සඳහා වන අත්‍යවශ්‍ය ගමන් වෙනුවෙන් පමණක් යෙදවීම මඟින් ඉන්ධන වියදම් මෙම ප්‍රමාණයෙන් පාලනය කර ගැනීමට හැකි විය. තවද මෙම දෙපාර්තමේන්තුව විද්‍යාගාර 10 කින් සමන්විත වන අතර ඉන් ශීතාගාර සහිත විද්‍යාගාර සහ රාත්‍රී කාලයේ ද උපකරණ ක්‍රියාත්මක විද්‍යාගාර නියමිත උෂ්ණත්වයක පැය 24 පුරා ක්‍රියාත්මක කල යුතු විය. අනෙකුත් උපකරණ සහ අත්‍යවශ්‍ය නොවන උපකරණ ක්‍රියාවිරහිත කර මෙම වියදම් මෙම සීමාවේ තබා ගැනීමට හැකි විය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව මුදල් වර්ෂය සඳහා සලසා තිබූ ප්‍රතිපාදන සීමාව ඉක්මවා එක් වැය විෂයයකට අදාලව රු.848,488 ක බැරකම් වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව කිසිම වියදමකට හෝ බැදීමකට හෝ නොබැදී සිටිය යුතු වේ. | අවශ්‍යතාවයන් සලකා බලා මෙම බැරකම් සඳහා එළඹ ඇත. |

## 2.3 නොසැසඳුණු අත්තිකාරම් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ACA 5 ආකෘතියෙන් ඉදිරිපත් කර තිබෙන අත්තිකාරම් ගිණුමට අදාල 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අය විය යුතු හිඟ ණය ශේෂය හා දෙපාර්තමේන්තු පොත් අනුව එම ශේෂය අතර පැවති රු.20,659 ක වෙනස 2019 දෙසැම්බර් 31 දිනට ද නිවැරදි කර නොතිබුණි. | අත්තිකාරම් බී ගිණුමේ වෙනස්කම් සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු වේ. | මෙම වෙනස පොත්වලින් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට 2018 මැයි 07 දින අධිකරණ අමාත්‍යාංශ ලේකම් මඟින් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා තිබුණ ද පොත් වලින් කපා හැරීමක් සිදු කර නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ විවිධ අංශයන්ගෙන් නඩු කටයුතු සඳහා විශේෂඥ වාර්තා ලබා ගැනීමේ අරමුණින් කැඳවා තිබූ වාර්තා වලින් 11,687 ක් 2018 දෙසැම්බර් 31 දිනට ලබාදීමට නොහැකිව තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී වාර්තා 43,229 ක් අධිකරණ මඟින් කැඳවා තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී අධිකරණය වෙත වාර්තා 40,745 ක් ලබාදී තිබුණු අතර වාර්තා 14,171 ක් ලබාදීමට නොහැකි වී තිබුණි. ඒ අනුව ලබාදීමට නොහැකි වූ වාර්තා ප්‍රමාණය පෙර වර්ෂය හා සැසඳීමේදී සියයට 18 කින් වර්ධනය වී තිබුණි. | වාර්ෂික නඩු වැඩිවීමේ සහ නඩු වාර්තා ලබාදීමේ ප්‍රවනතාවයට සාපේක්ෂව වාර්තා නිකුත් කිරීම් වැඩි කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ. | සහකාර රස පරීක්ෂක තනතුරු 31 ක් අළුතින් අනුමත කර ගැනීම සහ එම තනතුරු වලට බඳවා ගැනීමට කටයුතු කිරීම සහ සති අන්ත නිවාඩු දිනවල වැඩ කිරීම තුළින් වාර්තා නිකුත් කිරීමේ ප්‍රමාදය අවම කිරීමට කටයුතු කෙරේ. |

### 3.2 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක (i) හි 2003 වර්ෂයේ දේපල වලට සිදු වී තිබූ රු.2,229,111 ක අලාභයන් සහ 2018 වර්ෂය තුල වාහන අනතුරු වලින් රු.466,462 ක අලාභයක් අයකර ගැනීමට ඇති බව වාර්තා කර තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඉහත අලාභයන් පිළිබඳ විස්තර ඇතුලත් කර නොතිබූ අතර එම අලාභයන් අයකර ගැනීම හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර තිබීම පිළිබඳ විස්තර දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබූ හානි පාඩු ලේඛණය අනුව තහවුරු කර ගැනීමට නොහැකි විය. | පෙර වර්ෂ වලට අයත් අලාභ හානි ශේෂ වලින් අයකිරීම් හෝ කපාහැරීම් හා ඉදිරියට ගෙනයන ශේෂයන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කල යුතු වේ. | ලිපිලේඛන පරීක්ෂා කර බලා පොත්වලින් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වමි. වාහන අනතුරු වලින් සිදු වී ඇති අලාභය මේ වන විට රක්ෂණ සමාගම විසින් පියවා ඇත. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ හා තෘතීයික මට්ටමේ පුරප්පාඩු 55 ක්වූ අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 40 ක ප්‍රතිශතයක් විය. එකී පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට සෘජුවම බලපා තිබෙන බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ. කෙසේ වෙතත් එම තනතුරු වලට අදාල නව බඳවා ගැනීම් සඳහා වන ගැසට් නිවේදනය නිකුත් කිරීමට කටයුතු කරමින් තිබුණි. | ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවලට අදාල කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කල යුතු වේ. | එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් සිටී. |